Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# දෙවන වාර පරීක්ෂණය 2018

**8 ශ්‍රේණිය** **බුද්ධ ධර්මය** **කාලය පැය 02 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු දෙක බැගින් හිමිවේ.
- දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

---

## I - කොටස

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 සිඟාලෝවාද සූත්‍රයෙහි සඳහන් දිසා ගණන

(1) සයකි. (2) අටකි. (3) පහකි. (4) දොළහකි.

02 නව අරහාදී බුදු ගුණවලට අයත් නොවන ගුණයක් වන්නේ,

(1) අරහං ගුණයයි. (2) අකාලික ගුණයයි.

(3) සුගත ගුණයයි. (4) ලෝකවිදූ ගුණයයි.

03 බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනාවට අනුව පෙන්වා දී ඇත්තේ දුක

(1) තෙවැදෑරුම් බවයි. (2) හය වැදෑරුම් බවයි. (3) අට වැදෑරුම් බවයි. (4) නව වැදෑරුම් බවයි.

04 බුදු දහමෙහි සඳහන් වන භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන පිරිස හඳුන්වනු ලබන්නේ,

(1) සිව්බඹ විහරණ නමිනි. (2) සිව් සඟරාවත නමිනි.

(3) සතර සතිපට්ඨානය නමිනි. (4) සිව්වනක් පිරිස නමිනි.

05 " සුභද්‍රයෙනි භාග්‍යවතුන් වහන්සේ වෙහෙසට පත් නොකරන්න. උන්වහන්සේ ක්ලාන්තව වැතිර සිටිති. " යනුවෙන් පැවසුවේ,

(1) නන්ද තෙරණුවෝය. (2) අනඳ තෙරණුවෝය.

(3) ධර්මාරාම තෙරණුවෝය. (4) සැරියුත් තෙරණුවෝය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- **අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රකාශය හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් දී ඇති වරහන තුළ යොදන්න.**

06 තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් කාව්‍යශේඛරය නම් ග්‍රන්ථය රචනා කරන ලදී. ( )

07 විපරිනාම දුක්ඛ නමින් හඳුන්වනු ලබන්නේ වෙනස්වීම පිළිබඳ දුකයි. ( )

08 දැඩි ලෝභයෙන් වැළකී පරිත්‍යාගශීලී වීම සිතින් සිදුවන කුසල කර්මයකි. ( )

09 අපි ඇඳුම් ඇඳිය යුත්තේ මැසි මදුරු උවදුරු වලින් ආරක්ෂා වීම සඳහා පමණි. ( )

10 රාහුල කුමරුගේ මව වන්නේ මහාමායා දේවියයි. ( )

- **අංක 11 සිට 15 දක්වා ඇති වාක්‍යවල හිස්තැනට ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

( මුගලන් , සැරියුත් , තෙරුවන් , සුගත , ප්‍රථම )

11 නොමගට ගිය දේවදත්ත පාක්ෂික භික්ෂූන් සුමගට ගන්නා ලද්දේ ............................................................ මහ රහතන් වහන්සේ විසිනි.

12 ඡත්ත මානවක ගාථාවල.................................................................................................................ගුණ ඇතුළත් වේ.

13 බුදුරජාණන් වහන්සේ සුන්දර නිවන් මග ගමන් කර සුන්දර නිවනට වැඩම කළ නිසා.........................................................................නම් වන සේක.

14 ......................................................................... මහ රහතන් වහන්සේගේ බෑණනුවන් වූයේ දීඝනක පිරිවැජියාය.

15 බුදුරජාණන් වහන්සේගේ .............................................................................. ධර්ම දේශනාව වන්නේ ධම්මචක්කපවත්තන සූත්‍රයයි.

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශය සම්පූර්ණ කිරීමට සුදුසු නිවැරදි පිළිතුර B තීරුවෙන් තෝරා එහි අංකය A තීරුවේ තිබෙන වරහනෙහි යොදන්න.**

| | A | | | B |
|---|---|---|---|---|
| 16 | ධම්ම පදය නම් ග්‍රන්ථය අයත් වන්නේ, | (...........) | 1. | දෙව්රම් වෙහෙරයි. |
| 17 | සැවැත් නුවර අනේපිඬු සිටුතුමා විසින් කරවන ලද ආරාමය වන්නේ, | (...........) | 2. | ඛුද්දක නිකායටය. |
| 18 | කිඹුල්වත් පුර බුදුරජාණන් වහන්සේ වැඩ වාසය කළ ආරාමය වන්නේ, | (...........) | 3. | නිග්‍රෝධාරාමයයි. |
| 19 | කාන්තාවන් පන්සීයක් සමඟ පැමිණ කාන්තාවන්ට පැවිද්ද ලබාදෙන ලෙස බුදුරදුන්ගෙන් ඉල්ලා සිටියේ, | (...........) | 4. | මහා ප්‍රජාපතී ගෝතමී දේවියයි. |
| 20 | සිදුහත් කුමරුගේ මව වූයේ, | (...........) | 5. | මහාමායා දේවියයි. |

(ලකුණු 2 x 20 = 40)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, 02 සිට 07 දක්වා ප්‍රශ්නවලට ලකුණු 10 බැගින් ද හිමිවේ.**

01 කෙටි පිළිතුරු සපයන්න.

(i) ධර්ම රත්නයෙහි ගුණ දෙකක් නම් කරන්න.

(i) දිව්‍යාංගනාවක් ලබා ගැනීමට නම් භාවනා කළ යුතු යැයි බුදුරජාණන් වහන්සේ උපදෙස් ලබා දුන්නේ කාටද?

(iii) " මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි " යන සිල්පදයෙහි තේරුම ලියන්න.

(iv) ස්වාමියා විසින් භාර්යාවට ඉටු කළයුතු යුතුකම් දෙකක් ලියන්න.

(v) බෝධිසත්වයන් වහන්සේගේ ප්‍රඥා මහිමය ප්‍රකට වන ජාතක කථාව කුමක්ද?

(vi) පංචස්කන්ධයෙන් දෙකක් නම් කරන්න.

(vii) වචනයෙන් සිදුවන අකුසල කර්ම දෙකක් නම් කරන්න.

(viii) ලෝක පාලක ධර්ම නම් කරන්න.

(ix) බුදුදහමට අනුව කර්මයේ ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

(x) " කරන කළට පව් මීරිය මී සේ

විඳින කළට දුක් දැඩිවෙයි ගිනි සේ "

යන කවියෙහි ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න. (ලකුණු $10 \times 2 = 20$)

02 (i) දුක්ඛ සමුදය ආර්ය සත්‍යය යනු කුමක්ද? (ලකුණු 02 යි.)

(ii) බුදුදහමට අනුව තණ්හාව තුන් ආකාර වේ. ඒවා නම් කරන්න. (ලකුණු 03 යි.)

(iii) තණ්හාව දුකට හේතු වන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

03 (i) " යස්ස පාපං කතං කම්මං "යන ගාථාව සම්පූර්ණ කර ලියන්න. (ලකුණු 02 යි.)

(ii) එහි අදහස ලියන්න. (ලකුණු 03 යි.)

(iii) ඔබ විසින් කළයුතු කුසළ කර්ම පහක් ලියන්න. (ලකුණු 05 යි.)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

04 (i) ගිහියාගේ නිත්‍ය සීලය වන්නේ කුමක්ද? (ලකුණු 02 යි.)

(ii) අෂ්ටාංග සීලයෙහි පළවෙනි , දෙවෙනි හා තුන්වෙනි සිල් පද ලියන්න. (ලකුණු 03 යි.)

(iii) මත් ද්‍රව්‍ය භාවිත කිරීමෙන් මිනිසා විනාශයට පත්වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

05 (i) යුතුකම් ඉටු කිරීම පිළිබඳව සඳහන් වන සූත්‍රය කුමක්ද? (ලකුණු 02 යි.)

(ii) හිතමිතුරන් ඇසුරු කිරීමේදී අප අනුගමනය කළයුතු පිළිවෙත් පහක් බුදුරජාණන් වහන්සේ පෙන්වා දී ඇත. ඒවායින් තුනක් නම් කරන්න. (ලකුණු 03 යි.)

(iii) හොඳ මිතුරකු වීම සඳහා ඔබ තුළ ගොඩනගා ගත යුතු ගුණධර්ම මොනවාද? (ලකුණු 05 යි.)

06 (i) බුදුගුණ මෙනෙහි කරමින් කරනු ලබන භාවනාව කුමක්ද? (ලකුණු 02 යි.)

(ii) බුදුගුණ වලින් තුනක් නම් කරන්න. (ලකුණු 03 යි.)

(iii) බුදුගුණ භාවනාව වැඩිය යුතු ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

07 පහත සඳහන් මාතෘකාවලින් දෙකක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

(i) මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය

(ii) පිරිත් පින්කම

(iii) මුගලන් මහ රහතන් වහන්සේ

(iv) සීලය (ලකුණු 05 x02 =10 යි)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**8 ශ්‍රේණිය** **දෙවන වාර පරීක්ෂණය 2018** **බුද්ධ ධර්මය**

**පිළිතුරු පත්‍රය - I කොටස**

(01) 1 (02) 2 (03) 3 (04) 4 (05) 2 (06) ✓ (07) ✓ (08) ✓ (09) ×
(10) × (11) මුගලන් (12) තෙරුවන් (13) සුගත (14) සැරියුත් (15) ප්‍රථම
(16) 2 (17) 1 (18) 3 (19) 4 (20) 5

**II කොටස**

01 (i) ස්වාක්ඛාත , සන්දිට්ඨික , අකාලික , ඒහිපස්සික , ඕපනයික , පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහී (ල. 02)
(ii) නන්ද හාමුදුරුවන්ට (ල. 02)
(iii) " මම බොරුකීමෙන් වැළකීම නම් වූ ශික්ෂා පදය සමාදන් වෙමි. (ල. 02)
(iv) සම්මාන කිරීම , අවමන් නොකිරීම , වෙනත් කාන්තාවන් කරා නොයෑම , වගකීම් පවරා දීම , ඇඳුම් පැලඳුම් ලබාදීම. (ල. 02)
(v) උම්මග්ග ජාතක කථාව (ල. 02)
(vi) රූප , වේදනා , සංඥා , සංඛාරා , විඤ්ඤාණ (ල. 02)
(vii) බොරුකීම , කේලාම් කීම , පරුෂ වචන කීම , හිස් වචන කීම (ල. 02)
(viii) හිරි ඔත්තප්ප / ලජ්ජාව හා බිය (ල. 02)
(ix) කුසල කර්ම , අකුසල කර්ම (ල. 02)
(x) හැඳින එපවි දුරලන උපදේසේ
නොදුන මැනවි තුන්දොර අවකාසේ (ල. 02)

02 (i) දුක ඇතිවීමට බලපාන හේතුවයි (ල. 02)
(ii) කාම තණ්හා , භව තණ්හා , විභව තණ්හා (ල. 03)
(iii) ප්‍රශ්නයට අදාලව ලියා ඇති පිළිතුරට ලකුණු ලබා දෙන්න. (ල. 05)

03 (i) යස්ස පාපං කතං කම්මං
කුසලේන පිථීයති
සෝ ඉමං ලෝකං පභාසේති
අබ්භා මුත්තෝව චන්දිමා (ල. 02)
(ii) යමකු විසින් කරන ලද පාප කර්මය ඔහු විසින්ම කරන ලද කුසල කර්මයෙන් වැසී යයි ද ඒ තැනැත්තා වළා ගැබෙන් මිදුණු පුන් සඳ මෙන් මේ ලෝකය බබළවයි. (ල. 03)
(iii) ප්‍රශ්නයට අදාලව ලියා ඇති පිළිතුරට ලකුණු ලබා දෙන්න. (ල. 05)

04 (i) පංච ශීලය (ල. 02)
(ii) පාණාතිපාතා වේරමණී සික්ඛා පදං සමාදියාමි.
අදින්නාදානා වේරමණී සික්ඛා පදං සමාදියාමි.
අබ්‍රහ්මචරියා වේරමණී සික්ඛා පදං සමාදියාමි. (ල. 03)
(iii) ප්‍රශ්නයට ආදාළව ලියා ඇති පිළිතුරට ලකුණු ලබාදෙන්න. (ල. 05)

05 (i) සිඟාලෝවාද සූත්‍රය (ල. 02)
(ii) දානය , ප්‍රිය වචනය , අර්ථචර්යාව , සමානාත්මතාව , නොරැවටීම. (ල. 03)
(iii) ප්‍රශ්නයට ආදාළව ලියා ඇති පිළිතුරට ලකුණු ලබා දෙන්න. (ල. 05)

06 (i) බුද්ධානුස්සති භාවනාව (ල. 02)
(ii) අරහං , සම්මා සම්බුද්ධ , විජ්ජාචරණ සම්පන්න , සුගත , ලෝකවිදූ , අනුත්තරෝ පුරිසධම්ම සාරථී , සත්තා දේව මනුස්සානං , බුද්ධ , භගවා (ල. 03)
(iii) ප්‍රශ්නයට ආදාළව ලියා ඇති පිළිතුරට ලකුණු ලබාදෙන්න. (ල. 05)

07 මාතෘකා දෙකට අදාළව ලියා ඇති පිළිතුරුවලට ලකුණු ලබා දෙන්න.
( පෙළ පොතේ 3 , 4 , 27 , 45 , 60 , 61 පිටු බලන්න. )

(එක මාතෘකාවකට ලකුණු 05 බැගින් මාතෘකා දෙකට ලකුණු 10 යි.)